**රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**

-------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජුනි 15 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 ජුනි 19 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 13 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

## 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 08. 25 ඡේදය ප්‍රකාරව යම් වත්කමක් හුවමාරු නොවන ගනුදෙනුවක් හරහා අත්පත් කරගෙන ඇති විට, එහි පිරිවැය අත්පත් කරගත් දිනට පැවති සාධාරණ වටිනාකමට ගිණුම්ගත විය යුතු වුවත්, සභාවට ලැබී ඇති වත්කම් 04 ක් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි.

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසානයට වූ රු.1,237,000 ක ස්ථාවර වත්කම් ගිණුම්ගත නොකිරීම නිසා ස්ථාවර වත්කම් ගිණුමේ හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය රු.1,237,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත සඳහා 10% රඳවුම් මුදල වූ රු.357,503 ක වටිනාකම ගිණුම් ගතකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල ගිවිසුම්වලට එළඹෙන ලද දොරින් දොර ගමින් ගමට වැඩසටහනට අයත් ව්‍යාපෘති 25 ක් සඳහා දෙසැම්බර් 31 දිනට ණයහිමි සහ ණයගැති ප්‍රතිපාදන සලසා නොතිබූ බැවින්, රු.7,468,250 කින් ණයහිමි හා ණයගැති වටිනාකම් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.6,005,766 ක හිඟ හිටි ප්‍රාග්ධන ආධාර තුල සමාලෝචිත වර්ෂය තුල ඉටුකරන ලද කර්මාන්ත 08 කට අදාල රු.293,936 ක අත්තිකාරම් මුදලද ඇතුලත්ව තිබුණි.

## 1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

ගිණුම් විෂයයන් හතරකට අදාලව උපයෝගී ලේඛන අනුව ශේෂය රු.4,051,851 ක් වූ අතර, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව ශේෂය රු.3,087,511 ක් විය.

## 1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.9,067,500 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.8,601,084 ක් විය.

## 1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

රුපියල් 26,931,853 ක් වටිනා ගිණුම් විෂයයක් සඳහා හිමිකම් ඔප්පු හා පැවරුම් නියෝග ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 1.3.6 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 (ඕ) වගන්තිය | පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව පෙර පාසැල් සඳහා අවස්ථා 07 කදී රු.171,057 ක් වැයකර තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 14 හා 127 වගන්ති | වැය විෂයන් 09 ක් යටතේ රු.658,086 ක් ප්‍රතිපාදන ඉක්මවා වියදම් කර තිබූ අතර, ඒ සඳහා පරිපූරක වැය ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර සභාවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි
-----------------------------------

| | | |
|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 571 | තැන්පත් කර වසර 02 ක් තුල හිමිකම් නොපෑ රු.24,133 ක් වටිනා තැන්පතු 05 ක් නියාදනය කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 396(ඇ) | නිකුත් කර මාස 06 ක් ඉක්ම වූ ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් නොකළ රු.25,826 ක් වටිනා චෙක්පත් 06 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 1:6 වගන්තිය | සභාවේ සේවය කර ස්ථාන මාරුවීම් ලබා ගිය සේවකයින් 11 දෙනෙකුගෙන් වසර 02 සිට වසර 34 ක කාලයක සිට අය නොවී පවතින රු.50,128 ක සේවක ණය අය කර ගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය
-------------------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,356,498 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,291,192 ක් විය. ඒ අනුව රු.65,306 ක වාසිදායක විචලනයක් නිරීක්ෂණය විය.

### 2.2 ආදායම් පරිපාලනය
---------------------

#### 2.2.1 උසාවි දඩ හා මුද්දර ගාස්තු
-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු. 452,822 ක් හා මුද්දර ගාස්තු රු. 759,106 ක් ලැබිය යුතුව තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**
---------------------------

3.1 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**
------------------------------

3.1.1 කොන්ත්‍රාත් පරිපාලනය
---------------------------

සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ දොරින් දොරට ගමන් ගමට ග්‍රාමීය ප්‍රවේශ මාර්ග සංවර්ධනය, ග්‍රාමීය පාලම් නවීකරණය හා අලුතින් පාලම් ඉදිකිරීමේ වැඩසටහන යටතේ අනුමත කර 2014 තුලදී අත්තිකාරම් ගෙවීමට මුදල් ලබාදී තිබූ එකතුව රු.1,016,045 ක් වූ කර්මාන්ත 07 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විටත් ගිවිසුම් අත්සන් කර හෝ නොතිබුණි.

3.1.2 **නිෂ්ක්‍රිය වත්කම්**
-----------------

3.1.3 **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**
--------------------------------

සභාව විසින් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණයක් සිදු නොකරන අතර සභාව විසින් එක්රැස් කරනු ලබන කසල ආදාඋල්පත පොල භූමියෙහි අක්‍රමවත්ව බැහැර කරමින් පැවැතුණි.

4. **පද්ධති හා පාලන**
-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) කොන්ත්‍රාත් පාලනය